රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

හැඳින්වීම

2022 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහාද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ "2022 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත" 2021 සැප්තැම්බර් මස 29 වැනි දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

මෙම පනත් කෙටුම්පත මුදල් අමාත්‍යතුමා විසින් 2021 ඔක්තෝබර් මස 7 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලදී.

2022 විසර්ජන පනත් කෙටුම්පතේ දෙවෙනි වර කියවීමේ විවාදය මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා විසින් 2021 නොවැම්බර් 12 වැනි දින අයවැය කථාව ඉදිරිපත් කිරීමත් සමඟ ආරම්භ විය.

2022 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වී 2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය (මින් මතු 2022 මූල්‍ය වර්ෂය ලෙස සඳහන් වන) සඳහා සේවා වියදම් සැපයීම සඳහා රජයේ වියදම වශයෙන් ඇස්තමේන්තු කර තිබෙන රුපියල් දෙදහස් පන්සිය පස් බිලියන තුන්සිය හතලිස් හය මිලියන පන්සිය පනස් අට දහසක් වෙනත් වියදමක් සඳහා බලය ලබා දෙන වෙනත් නීතියක තිබෙන කිසිවකට අගතියකින් තොරව පනත් කෙටුම්පතේ විධිවිධාන අනුව පහත ආකාරයට සිදු කරනු ලැබේ.

(අ) රජය සතුව පවතින ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනත් අරමුදලකින් හෝ මුදලින් ගෙවීමට බලය පවරා ඇති ගෙවීම් වලින් හෝ ; සහ

(ආ) රජය වෙනුවෙන් සහ රජය සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත මුදල් ලබා ගැනීම සඳහා මෙහිදී බලය ලබා දී ඇති පරිදි 2022 මූල්‍ය වර්ෂය තුළ ලබා ගත් ණය වලින් ගෙවීමට තිබෙන ශේෂය ඕනෑම අවස්ථාවක රුපියල් බිලියන තුන්දහස් එකසිය අසූහතර බිලියන හාරසිය හැත්තෑ මිලියනයක් නොඉක්මවන සහ එවන් ණයවල විස්තර 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 13 වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම අවශ්‍ය වන අවසන් අයවැය තත්ත්ව වාර්තාවේ ඇතුලත් කරන පදනම් මත;

එසේ වුවද, මෙම කොටසේ විශේෂයෙන් සඳහන් කර තිබෙන 2022 මූල්‍ය වර්ෂය තුළ ලබාගෙන තිබෙන ණය ගණනය කිරීම සඳහා කෙටි කාලීන ණය මුදල් ප්‍රමාණය තීරණය කිරීමේදී, 2022 මූල්‍ය වර්ෂය තුළදී ලබාගත් කෙටිකාලීන ණය ප්‍රමාණය සහ 2022 වර්ෂය තුළදී කරනු ලබන සම්පූර්ණ කෙටි කාලීන ණය පියවීම් ප්‍රමාණය අතර වූ වෙනස පමණක් සළකා බලනු ලැබේ.

ස්ථාවර නියෝග සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව

අයවැය වාර්තාව ඉදිරිපත් කිරීමෙන් සහ විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමෙන් අනතුරුව දින හතරක් ඇතුළත සමස්ත ඇස්තමේන්තුගත වියදම සහ ආදායම වෙත එළඹීම සඳහා පදනම ලෙස භාවිතා කරන ලද මූල්‍ය, මුදල් සහ ආර්ථික උපකල්පනයන් පිළිබඳ වාර්තාවක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ස්ථාවර නියෝග 121(5) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වේ.

2021 නොවැම්බර් මස 13 වන දින පවත්වන ලද සිය රැස්වීමේදී කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරුන් සහ පහත සඳහන් නිලධාරීන් සමඟ මෙම වාර්තාව සැකසීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදි.

- ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය, විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- ආචාර්ය නිශා අරුණතිලක මහත්මිය, පර්යේෂණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- එස්.එම්.ඩී.එස්.එස්. රෝහිත මහතා, නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
- ජී.එච්.ඩී. ධර්මපාල මහතා, නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
- ඩී.ඒ.ඒ. වනිගසේකර මහතා, සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
- ආචාර්ය කපිල සේනානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- ඩී. කොටින්කඩුව මහත්මිය, අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- කේ.එම්. කුමාරසිරි මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- පී. කොඩිප්පිලි මහතා, සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
- ජූඩ් නිලුක්ෂාන් මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
- අනෝමා නන්දනී මෙනෙවිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

තක්සේරුව

මෙම වාර්තාවේ විශ්ලේෂණය අංශ තුනකින් යුක්තය. පළමු අංශය මූල්‍ය පාලන, මුදල් හා ආර්ථික උපකල්පනයන් තක්සේරු කරනු ඇත. දෙවැන්න තක්සේරු කරනුයේ ආදායම් ඇස්තමේන්තුය. එමෙන්ම තුන්වන අංශය අයවැයෙහි වියදම් ඇස්තමේන්තු තක්සේරු කරනු ඇත. මෙම විශ්ලේෂණය උද්ධමනය සඳහා ගැලපුම් සීරුමාරු කිරීමෙන් තොරව, වෙළඳපල අගයන් භාවිත කරමින් සිදු කෙරේ.

1 කොටස: මූල්‍ය පාලන, මුදල් හා ආර්ථික උපකල්පන

1. ආර්ථික සන්දර්භය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2021 මැද සිට ක්‍රියාත්මක කරන ලද කොවිඩ්-19 සඳහා අඛණ්ඩ එන්නත්කරණයේ ආධාරයෙන් මන්දගාමීව නමුත් සිදුවන නියත යථා තත්ත්වයට පත්වීමක් දකිමින් සිටී. එසේ වුවද, වර්ෂය අවසානයේ වර්ධනය මුලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙනුයේ ඉතා බලවත් 3 වන ආසාදන රැල්ලක් ඇති වී එයට ප්‍රතිචාර වශයෙන් පනවන ලද සීමා නිසාය. 2021 වසරේ 4 වන කාර්තුව සිට ආර්ථිකය ආරක්ෂාකාරීව හා සුමට ලෙස විවෘත වෙතැයි අපේක්ෂා කළද, වයිරසයේ ගමන් මග පිළිබඳ අවිනිශ්චිතතාවක් පවතී.

වසංගතය යලිත් වරක් අනපේක්ෂිත පැතිර යාමේ අවදානමක් ප්‍රදර්ශනය කර තිබේ. වසංගත කාලය මුළුල්ලේම රැකිරක්ෂා, මහජන සේවා හා ව්‍යාපාර වලට ආධාර කිරීම සඳහා ගනු ලබන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග මගින් රාජ්‍ය මුදල් හා ණය බර දැඩි පීඩනයකට ලක් කළේය. ඒ සමගම, යෙදවුම්වල නිෂ්පාදනය අභිභවා ඉල්ලුම වැඩි වීම හේතුවෙන් භාණ්ඩ හා අමුද්‍රව්‍ය මිල සැලකිය යුතු ලෙස ඉහළ යාම නිසා විදේශ පෙරමුණ මත නවමු අභියෝග එල්ල වනු ඇත. ශ්‍රී ලංකාව හදිසි උපකාර වෙතින් සංක්‍රාන්ත වීමට සූදානම් වන අතරේ, මූල්‍ය කටයුතු තිරසාර පථයක ගමන් කරන බවටත්, මධ්‍යකාලීනව ණය බර පහත වැටෙන බවටත් වගබලා ගැනීම සාර්ව ස්ථායිකරණ ප්‍රයත්නයන් සඳහා ඉතා වැදගත් වේ.

1.1 ආර්ථික වර්ධනය

නැවත වරක් 2020 වර්ෂයේ 3 වන කාර්තුවේ සිට ආර්ථිකය ධන වර්ධනයක් අත්කර ගනිමින් සිටින අතර, 2021 වර්ෂයේ 2 වන කාර්තුවේ කොවිඩ්-19 රැල්ලක් මගින් යලිත් වරක් ආර්ථික කටයුතු අඩාල කරන ලදී. දේශීය මෙන්ම විදේශීය කරළිය තුළ දුර්වල වෙමින් ඇති මූල්‍ය තත්ත්වයක් සමග, ශ්‍රී ලංකාවේ වර්ධන දසුන පහළ යනු දකින්නට ලැබුණි. බහු-පාර්ශ්වික මූල්‍ය ආයතන (MFIs) විසින් 2021 වර්ෂය සඳහා කරන ලද සම්මති පුරෝකථනය 2021 ඔක්තෝබර් වන විට 3.5–4.0% ක් ව පැවතුණි. එයට පරස්පර ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වර්ෂය අවසානය සඳහා වඩා සුභවාදී 5% ක් ප්‍රක්ෂේපණය කළේය.



මූලාශ්‍රය: ජන සංගණන හා සංඛ්‍යාන දෙපාර්තමේන්තු දත්ත

2021 සැබෑ වර්ධනය මගින් 2022 වර්ෂය සඳහා ප්‍රක්ෂිප්ත වර්ධන වේගය මත බලපෑමක් ඇත (පාදක ඵලය). 2021 සඳහා අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය දක්වා නොමැත. එහෙත්, මුදල් අමාත්‍යාංශය උපකල්පිත වර්ධන වේගය 4.8% යැයි පැහැදිලි කොට ඇත. මෙය අයවැය (2021-2022) ඇස්තමේන්තු සාරාංශය පාදක වූ නාමික දළ දේශීය නිෂ්පාදිතය අනුව ගණනය කර ඇත. එය 10.3% ක නාමික දළ දේශීය නිෂ්පාදිතයක් උපකල්පනය කරයි. එයට යාව, වාර්ෂික උද්ධමනය 5.2% ක්

වෙතැයි උපකල්පනය කරන අතර එය 2021 සැප්තැම්බර් වන විට තිබූ වාර්ෂික උද්ධමන අනුපාතිකය (ජා.පා.මී.ද.) වන 5.5% ට වඩා අඩුය.

වර්ෂයේ පළමු අර්ධය තුළ වාර්තා කරන ලද 8% ක වර්ධනය සමගින්, 3 වන කාර්තුවේ සංචරණ සීමා හේතුවෙන් වර්ධනය පහළ පැවතුනද, එය ධනාත්මකව පවතිනු ඇතැයි යන උපකල්පනය අනුව, වර්ෂය අවසාන වන විට 4.5% ක මූර්ත නිමැවුම් වර්ධනයක් අත්කර ගත හැකිය.

1.1 වගුව: නාමික දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තුව

	2018	2019	2020	2021	2022
නාමික දළදේශීය නිෂ්පාදිතය (ලංකා රුපියල් බිලියන)	14,291	15,013	14,973	16,476	18,511
දළදේශීය නිෂ්පාදිත වර්ධනය (%)	7.2	5.1	-0.3	10.3	12.4
මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව නාමික දළදේශීය නිෂ්පාදිත වර්ධනය					
නාමික දළදේශීය නිෂ්පාදිත වර්ධනය (%)					12.4
අවධමනකය (%)					7.0
මූර්ත දළදේශීය නිෂ්පාදිත වර්ධනය (%)					5.0

මූලාශ්‍රය: අයවැය සාරාංශය (2021 – 2022) සහ මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු

ශ්‍රී ලංකාව පිළිබඳව බහු-පාර්ශ්වික මූල්‍ය ආයතන (MFIs) පුරෝකථනයන් මගින් 2022 තුළ වර්ධනය මන්දගාමී වනු ඇතැයි යෝජනා කෙරෙන නමුදු, මුදල් අමාත්‍යාංශය 5.0% ක ශක්තිමත් වර්ධන ප්‍රතිදානයක් අපේක්ෂාවෙන් සිටී. ආර්ථිකය වසංගතය පැමිණීමට පෙර තිබූ මට්ටම්වලට ආර්ථිකය යලි ඉහළ නැගි විට නිමැවුම ඉහළ නැංවීම වඩාත් භාරදූර කාර්යයයි. සීමා ලිහිල් කිරීම හා යලි ආර්ථික ක්‍රියාකාරිත්වය ඇති වීම මගින් නිමැවුම යලි පණ ගැන්වීමට පිටිවහලක් ලැබෙන අතරම, මතු දැක්වෙන හේතු නිසා වර්ධන ප්‍රක්ෂේපනයේදී යම් සුපරීක්ෂාකාරිත්වයකින් සලකා බැලිය යුතුය:— (1) මූලාශ්‍ර කිහිපයක සංකලනයක් මගින් උද්ධමන පීඩනයන් 2022 තුළ ඉහළ පවත්වා ගෙන යාමත් ඉල්ලුම පහත හෙලීමත් අපේක්ෂා කළ හැකිය. (2) 2022 අයවැය දේශීය බැංකුවලින් ණය ගැනීම මත රඳා පවතින මට්ටම ඉහළ පවතිනු ඇත. මෙය වඩා ඉහළ පොළී අනුපාතික සමගින් මැදිහත්වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට කරන අත වැනීමකි; එමගින් පුරෝකථනය කළ ආර්ථික වර්ධනයට තර්ජන එල්ල වීම, රාජ්‍ය ආදායම් දුර්වල වීම හා ආයෝජන සඳහා අවකාශය අඩු කිරීම සිදු කිරීමට ඉඩ ඇත.

වගුව 1.2: දළ දේශීය නිෂ්පාදන වර්ධනය පුරෝකථන

	2021	2022
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	2021 ඔක්තෝබර් වන විට 3.6%, 2021 අප්‍රේල් හි වූ 4% සිට අඩුවීමක්	2021 ඔක්තෝබර් වන විට 3.3%
ලෝක බැංකුව	2021 ඔක්තෝබර් වන විට 3.3%, 2021 අප්‍රේල් හි වූ 3.4% සිට අඩුවීමක්	2021 ඔක්තෝබර් වන විට 2.1%
ආසියානු සංවර්ධන බැංකුව	2021 ඔක්තෝබර් වන විට 3.3%, 2021 අප්‍රේල් හි වූ 4.1% සිට අඩුවීමක්.	2021 අගෝස්තු වන විට 3.4%.
ශ්‍රී ලංකා මහ බැංකුව	2021 ඔක්තෝබර් වන විට 5%, 2021 අප්‍රේල් හි වූ 6% සිට අඩුවීමක්.	2021 ඔක්තෝබර් වන විට 5.5 - 6% .
මුදල් අමාත්‍යාංශය	2021 නොවැම්බර් වන විට 4.8%	2021 නොවැම්බර් වන විට 5%

මූලාශ්‍රය: වගුවේ දක්වා ඇති පරිදි

1.2 උද්ධමනය

ඉහත සඳහන් කළ ආකාරයට ශ්‍රී ලංකා ආර්ථිකය තුළ තිබෙන උද්ධමනාත්මක පීඩනයන් තවදුරටත් ඉහළ යාමක් 2022 දැකිය හැකිවනු ඇත. ගෝලීය වශයෙන් ද උද්ධමන අනුපාතයන් වැඩිවන නමුත් දියුණු ආර්ථිකයන් බොහොමයක එය තාවකාලික සංසිද්ධියක් වේ. ශ්‍රී ලංකාවේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වන උද්ධමන අනුපාතය ඉලක්කගත 6% ඉහළ සීමාව දැනටමත් බිඳ දමා තිබෙන අතර ඉදිරි මාස සඳහා වන අපේක්ෂාවන් තීරණය වන්නේ කොවිඩ් 19 ට අදාළ මූල්‍ය ලිහිල්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ගන්නා ප්‍රතිපත්ති තීරණ මතය.

උද්ධමනය සම්බන්ධ අනෙකුත් සැළකිය යුතු මූලාශ්‍ර ලෙස 1) ගෘහස්ථ සැපයුම් වලට බාධාවීම, විශේෂයෙන්ම ආහාර සම්බන්ධව, 2) රුපියල අවප්‍රමාණය වීම හරහා සිදුවන ආනයනික උද්ධමනය, 3) ජාත්‍යන්තර ගෑස් සහ තෙල් මිල ඉහළ යාම සහ 4) වැටුප් ඉල්ලුම් පීඩනයන් දැක්විය හැකිය. මෑත මාස කිහිපය තුළ උද්ධමනාත්මක අපේක්ෂාවන් මත බලපෑමක් ඇති කිරීම සඳහා වන මූල්‍ය ප්‍රතිපත්තිය දැඩිවීම මත 2022 අයවැය 2022 සඳහා 6-7% ක වාර්ෂික උද්ධමන අගයක් අපේක්ෂා කර තිබේ. වර්තමාන ප්‍රවණතාවන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිල ස්ථායිතාව සම්බන්ධයෙන් ලබාදෙන ප්‍රමුඛතාව මත පදනම්ව උද්ධමනය ඉහළ සීමාවේ (7%) හෝ මදක් ඉහළ අගයක් ගත හැකිය.



මූලාශ්‍රය: ජන සංගණන හා සංඛ්‍යාන දෙපාර්තමේන්තු දත්ත

1.3 පොළී අනුපාත

ලංකාවේ රාජ්‍ය මූල්‍ය, ආණ්ඩුවේ ණය සහ උද්ධමනය මත ගෙවන පොළී අනුපාත වල සිදුවන වෙනස්කම් ද ඇතුළුව, අනාගත කම්පනයන්ට භාජනය වීමේ තත්ත්වයක් ද පවතියි. මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව වර්තමාන එක් වසරක භාණ්ඩාගාර බිල්පත් වටිනාකම භාවිතා කර තිබේ. 2021 අගෝස්තු මස බදු ප්‍රතිපත්ති පොළී අනුපාත ඉහළයාම සහ ප්‍රතිදාන පාලන ක්‍රියාමාර්ග ලිහිල් කිරීම තුළ පොළී අනුපාත උඩුකුරු ගැලපුමක් ඇතිවී තිබේ.



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහබැංකුවේ දත්ත

වර්තමානයේ පොළි අනුපාත වල ඇති උඩුකුරු විතැන්වීම 2022 වසර තුළත් පවතිනු ඇති බව සියළු දර්ශකයන්ගෙන් පෙනී යයි. අයවැය සාරාංශය (2021-2022) අනුව දේශීය බැංකු නොවන මූල්‍යකරණය මත විශ්වාසය තැබීම, සමස්ථ රාජ්‍ය මූල්‍ය මූල්‍යකරණ පරතරය සහ වෙනත් වෙළෙඳපොළ නොවන ණය ගැනීම් වලට අදාළ වන සැළකිය යුතු අවිනිශ්චිතතාවන් මත අඛණ්ඩව ඉහළ යාමක් සිදුවනු ඇති අතර එය රුපියල් බිලියන 501 ක් දක්වා එනම් 2021 ප්‍රෝකථනය කළ දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.2% සිට දළ දේශීය නිෂ්පාදිතයෙන් ඇස්තමේන්තුගත 2.7% ක් දක්වා වර්ධනය වනු ඇත.

.

වගුව 1.3: දේශීය මූල්‍යකරණය (ද.දේ.නි. % ලෙස)					
	2018	**2019**	**2020**	**2021**	**2022**
රාජ්‍ය මූල්‍ය හිඟය	5.3	9.6	11.1	11.1	8.8
දේශීය මූල්‍යකරණය	2.9	6.0	11.7	11.4	9.8
බැංකු ණය සහ වෙනත්	1.0	1.5	2.0	2.2	2.7

මූලාශ්‍රය: අයවැය සාරාංශය (2021-2022)

1.4 විනිමය අනුපාතය

සංචාරක කර්මාන්තය වැනි විදේශ විනිමය උපයන වැදගත් මූලාශ්‍ර සිඳී යාමත්, ඊටත් අමතරව ස්වෛරී ණය ශ්‍රේණිකරනය පහළ දැමීම සහ බැඳුම්කර ආපතනය පුළුල් කිරීම නිසා සාධාරණ පොළී අනුපාත වලට ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොලට ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාවට ඇති නොහැකියාවත් රුපියල මත අඛණ්ඩව පීඩනයක් එල්ල කිරීමට හේතු වී ඇත.

මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එක්සත් ජනපද ඩොලර් 200 ට පාදක වූ අනුපාතයක් 2022 මෙම මට්ටම් වල මුදල ස්ථාවර වීමට අපේක්ෂා කළ උපකල්පනය මත භාවිතා කළ බව පෙනේ. මෙම උපකල්පනය පහත සඳහන් කාරණා නිසා යථාර්තවාදී නොවන බව පෙනේ.

1) රුපියල වර්තමානයේ නිල වශයෙන් ඇ.ඩො. 200 ක පවත්වාගෙන යන අතර සමාන්තර වෙළෙඳපොළ අනුපාත අනුව එය වැඩි අගයක් ගනියි. 2) ශ්‍රී ලංකා මහ බැංකුවට වෙළෙඳපොලට ඩොලර් ලැබෙන ණය මාර්ග ආරක්ෂා කර ගැනීමට හැකිවන්නේ නම් රුපියලේ චලනයන් මත පවතින වර්තමාන සීමා කිරීම් ලිහිල් කිරීමට හැකිවනු ඇත. ලිහිල් කිරීම ඉවත් කරන විට සමපේක්ෂණ හැසිරීම මත මූලික වශයෙන් සීමාව ඉක්මවායාමක් ඇතිවිය හැකි අතර, ඉන්පසු උපකල්පිත රු.200 ට වැඩි අනුපාතයක ස්ථාවර වීමක් සිදුවිය හැකිය. එයට හේතුව වන්නේ දළ ගලා ඒම් අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ණය ගැලපුම් සඳහා ලැබීම අවශ්‍ය වීමත් සංචිත සඳහා වන ඉතා පහළ සීමාවත් සහතිකවම

ලැබේ යැයි කිවහැකි ගලාඒම් නැතිකමත්, මුදල් වල ස්වභාවය පිළිබඳ වෙළෙඳපොළ ආකල්ප ඇති කිරීමට හේතු වන නිසාය.



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත

ඒ අනුව, ණය සේවාකරණයේ සහ ගෙවිය යුතු ණය ප්‍රමාණයේ රුපියල් වටිනාකම සමස්ථ රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල වෙත ළඟාවන ඇස්තමේන්තු වලින් සැළකිය යුතු ලෙස වෙනස් විය හැකිය.

II වන කොටස: ආදායම් ඇස්තමේන්තු තක්සේරු කිරීම

2022 වසර සඳහා වූ අයවැය මඟින් රජයේ මුළු ආදායම ශ්‍රී.ල.රු. බිලියන 2,213 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත (2.2 වගුව බලන්න). මෙය 2021 වසර සඳහා අපේක්ෂිත ආදායමට වඩා 48% ක වැඩිවීමකි. මෙය 2020 සිට 2021 දක්වා අත්දකින ලද 9.3%[11] ක වැඩිවීමට සාපේක්ෂව පස් ගුණයකට වඩා වැඩි වර්ධනයකි. සංඝටක කොටස් තුල ඇති මුළු ආදායම් ඇස්තමේන්තුව විමසා බැලීම මඟින් මෙම සුවිශේෂී වැඩිවීම සාධාරණීකරණය කිරීම සඳහා අයවැය තුල ඉදිරිපත් කොට ඇති උපකල්පනයන් සහ ක්‍රියාවන් මෙහිදී ඇගයීමට ලක් කරනු ලැබේ



[1] අයවැය කථාවට අනුව 2022 සඳහා අපේක්ෂිත ආදායම ශ්‍රී.ලංරු. බිලියන 2,274. මෙයින් ශ්‍රී.ලංරු. බිලියන 333 ක් නව ආදායම් යෝජනා වලින් (අයවැය කථාවේ 3 ඇමුණුම) ලැබෙන ඒවාය. නව ප්‍රතිපත්ති (ශ්‍රී.ලංරු. බිලියන 333 න්) වලින් අපේක්ෂිත ආදායම අවකරණය කිරීමෙන් අනතුරුව ශ්‍රී.ලංරු. බිලියන 1941 ක ආදායමක් මෙමගින් ලැබෙනු ඇත. ශ්‍රී.ලංරු. බිලියන 1556 ක් වූ 2021 සමස්ත ආදායමෙන් මෙය 25% ක වැඩිවීමකි. නාමික දල දේශීය නිෂ්පාදනය 12% ක් පමණ ලෙස ඇස්තමේන්තු කළ විට (සත්‍ය දල ජාතික නිෂ්පාදන වර්ධනය 5% හා උද්ධමනය 6-7%), වැඩිවූ ආර්ථික කටයුතු හේතුවෙන් ආදායමේ අපේක්ෂිත වර්ධනය ලගා කර ගත නොහැකි තත්වයක් ඇත.

2.1 වගුව: අයවැය ඇස්තමේන්තු (ශ්‍රී.ල.රු. බිලියන)					
	ආදායම	**2019**	**2020**	**2021 ඇස්තමේන්තුගත**	**2022 ඇස්තමේන්තුගත**
	මුළු	1,891 (100%)	1,368 (100%)	1,495 (100%)	2,213 (100%)
	බදු ආදායම	1,735 (92%)	1,216 (89%)	1,325 (89%)	1,987 (90%)
1	ආදායම් බදු	428 (23%)	268 (20%)	295 (20%)	496 (22%)
2	භාණ්ඩ හා සේවා මත බද්ද	976 (52%)	587 (43%)	650 (43%)	1,031 (47%)
2.1	එකතු කළ අගය මත බද්ද (VAT)	444 (23%)	234 (17%)	310 (21%)	424 (19%)
2.2	එයින්, සුරාබදු	399 (21%)	322 (24%)	311 (21%)	430 (19%)
3	බාහිර වෙළඳාම මත බදු	332 (18%)	362 (26%)	380 (25%)	450 (21%)
3.1	එයින්, ආනයන බද්ද / සෙස් බද්ද	149 (8%)	163 (12%)	180 (12%)	205 (9%)
3.2	එයින්, ව.ගු.ස.බ./ වි.වෙ.බ.	183 (10%)	198 (14%)	200 (13%)	255 (12%)
4	බදු නොවන ආදායම	156 (8%)	151 (11%)	170 (11%)	226 (10%)

මූලාශ්‍රය: මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

2.2 වන වගුව තුල දක්වා ඇති පරිදි අයවැය (2021 – 2022) සාරාංශය තුල ඉදිරිපත් කොට ඇති මුළු ආදායම් ඇස්තමේන්තු සහ මුදල් අමාත්‍යාංශය (මු.අ.) විසින් සපයා දී ඇති තොරතුරු වල යම් යම් වෙනස්කම් පවතී. එම මූලාශ්‍රය වෙතින්ම නාමික ද.දේ.නි. සුළු විචල්‍යයක් වෙනුවෙන් ගැලපීම මඟින් 2022[2] වසර සඳහා වූ ද.දේ.නි. 12% ක මුළු ආදායම් ඇස්තමේන්තුව ලබා දේ.

2.2 වගුව: මුළු ආදායම් ඇස්තමේන්තුවල සහ නාමික ද.දේ.නි. වෙනස්කම්				
	2022 අයවැය කථාව		**මු.අ. විසින් සපයා දී ඇති තොරතුරු**	
	2021	**2022**	**2021**	**2022**
මුළු ආදායම (ශ්‍රී.ල.රු.බිලියන)	1,556	2,274	1,495	2,213
නාමික ද.දේ.නි. (ශ්‍රී.ල.රු.බිලියන)	16,553	18,488	16,476	18,488
ආදායම / ද.දේ.නි (%)	9.4	12.3	9.1	12.0

සටහන - අයවැය කථාවේ සහ මුදල් අමාත්‍යාංශය ලබා දුන් තොරතුරු වල වෙනස් වූ කොටස 2022 අයවැය කථාවේ ශ්‍රී.ල.රු. බිලියන 60 ක පළාත් සභා ආදායම ඇතුළත්වීම නිසා සිදුව ඇත. .

[2] අයවැය කථා 2022වේ ශ්‍රීක පළාත් සභා ආදායම ඇතුළත්වීම නිසා සිදුව ඇති වෙනසේ කොටස 60 බිලියන .රු.ල.

2.3 වගුව: අයවැය කථාවේ සහ ප්‍රකාශයට පත් කොට ඇති ඇස්තමේන්තුවල ඇති වෙනස්කම් සහ රජයේ ආදායම සඳහා පුර්ව උපකල්පන (ශ්‍රී.ල.රු. බිලියන)			
	2022 අයවැය කෙටුම්පතේ 1-111 දක්වා ඇස්තමේන්තු වෙතින්ᵠ	**2022 අයවැය කථාව / 2021 .11.12 දිනැති ඇස්තමේන්තු වෙතින්ᵠᵠ**	**කෙටුම්පත් කළ අයවැය ඇස්තමේන්තුවලින් වෙනස වෙළුම 1-111[a]**
මූළු	1,914	2,213	299 (15.6%)
බදු ආදායම	1,748	1,987	239 (13.7%)
ආදායම් බද්ද	396	496	100 (25.3%)
භාණ්ඩ හා සේවා මත බද්ද	861	1,031	170 (19.7%)
එ.අ.බ. (VAT)	410	424	14 (3.4%)
එයින්, සුරාබදු	430	430	0 (0.0%)
බාහිර වෙළඳාම මත බදු	478	460	-18 (-3.8%)
එයින්, ආනයන බද්ද/ සෙස් බද්ද	220	205	-15 (-6.8)
එයින්, ව.ගු.බ./ වි.වෙ.බ.	255	255	0 (0.0%)
බදු නොවන ආදායම	229	226	-3 (-1.3%)

සටහන - අ. වටිනාකම් ගිණුම් හැඩතලය අනුකූලව ආ. වටිනාකම් ආර්ථික විග්‍රහයට අනුකූලව මෙන්ම වටිනාකම් තුළ ආදායම් යෝජනා අඩංගුවේ. අයවැය කථාව තුළ ආදායම් යෝජනා ඇතුළත් කිරීම නිසා, ගිණුම් සහ ආර්ථික හැඩතල යෙදවීම නිසා වෙනස්කම් ඇති වී ඇති බව නිරීක්ෂණය වේ.

මූලාශ්‍රය: මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව , මුදල් අමාත්‍යාංශය

2.1 ආදායම් බදු

2.1.1 ආදායම් බදු ආදායම් ඇස්තමේන්තු

2022 වසර සඳහා අපේක්ෂිත බදු ආදායම් එකතුව මත ශ්‍රී.ල.රු. බිලියන 1,987න් 25% ක් වන ශ්‍රී.ල.රු. බිලියන 496 ක් ආදායම් බදු ආදායම ලෙස උපයා ගැනීමට රජය අපේක්ෂා කරයි (2.4 වගුව). 2021 වසර සඳහා අපේක්ෂිත ආදායම් බදු ආදායම වන ශ්‍රී.ල.රු. බිලියන 295 වෙත ළඟාවීම මත පදනම්ව, 2022 අයවැය මඟින් 2022 වසර තුල 68% ක ආදායම් බදු ආදායම් වර්ධනයක් ඇස්තමේන්තු ගත කරයි. ද.දේ.නි සම්බන්ධයෙන් සළකා බැලීමේදී, 2021 වසරේදි 1.8% ක් වූ ආදායම් බදු ආදායම 2022 වසරේදි 217% දක්වා ඉහළ යනු ඇති බවට අපේක්ෂා කෙරේ (2.5 වගුව). 2020 හා 2021 ආර්ථික ක්‍රියාකාරකම් කොවිඩ් 19 වසංගයේ බලපෑම් වලට ලක්වීම නිසා, 2020/2021 සංඛ්‍යාලේඛන 2022 සංඛ්‍යා සමඟ ගැලපීම සාධාරණ නොවේ.

2.4 වගුව: ආදායම් බදු									
	ශ්‍රී.ල.රු. බිලියන							**% වෙනස**	
	2016	**2017**	**2018**	**2019**	**2020**	**2021 ඇ.**	**2022 ඇ.**	**2019 - 2020**	**2021ඇ - 2022 ඇ**
බදු ආදායම	1,464	1,670	1,712	1,735	1,217	1,325	1,987	-29.9	50.0
ආදායම් බද්ද	259	275	310	428	268	295	496	-37.3	68.1
සංස්ථාපිත/ සංස්ථාපිත නොවන	154	144	170	273	228	268	466	-16.2	73.9

උපයන විට ගෙවීමේ බද්ද (PAYE)	28	33	41	49	15	15	18	-69.7	20.0
රඳවා ගැනීමේ බද්ද (ර.බ)	56	53	46	50	10	11	12	-80.2	9.1
ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා.)	20	45	53	55	15	1	0	-73.0	-100.0

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ආර්ථික වර්ගීකරණය සහ 2022 අයවැය කථාව මඟින් ඉදිරිපත් කරන ලද දත්ත.

සටහන - වසර අවසානයේ ''ඇ'' යන්නෙන් ඇස්තමේන්තුගත වටිනාකම් අදහස් කෙරේ.

2.5 වගුව: ආදායම් බදු ඇස්තමේන්තු ද.දේ.නි. හි කොටසක් ලෙස		
	ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස	
	2021	**2022**
බදු ආදායම	8.04	10.73
ආදායම් බද්ද	1.79	2.68
සංස්ථාපිත	1.54	2.37
උපයන විට ගෙවීම	0.09	0.10
රඳවාගැනීමේ බද්ද	0.07	0.06

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව-2020 ආර්ථික වර්ගීකරණය අනුව සමූහනය කරන ලද දත්ත සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය. 2021 සහ 2022 වෙනුවෙන් ද.දේ.නි. වටිනාකම් පිළිවෙලින් ශ්‍රී.ලං.රු. බිලියන 16,476 ක් සහ ශ්‍රී.ලං.රු. බිලියන 18,511 ලෙස දක්වනු ලැබ ඇත.

බදු ආදායමේ සමස්ත වර්ධනය අත් කර ගැනීමට අපේක්ෂා කෙරෙන්නේ අලුත් බදු දෙකක් යෝජනා කිරීමෙනි. අධිභාර බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්වය. ශක්තිමත් කරන ලද බදු පරිපාලනයද ආදායම් සහ ලාභ මත බදු වලින් ආදායම මත සාධනීය බලපෑමක් ඇති කිරීම අපේක්ෂිතය. එක් එක් ආදායම් කාණ්ඩය පිළිබඳ වඩාත් විස්තරාත්මක තක්සේරුවක් පහත සාකච්ඡා කෙරේ.

2.1.2 සංස්ථාපිත බද්ද

2022 අපේක්ෂිත ආදායම් බදු ආදායමෙන් 94% කට දායක වන ශ්‍රී ලංකා රුපියල් බිලියන 466 ක් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම ලෙස රජය අපේක්ෂා කරයි. 2021 රැස් කර ගනු ලබන මුළු සංස්ථාපිත බදු ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් බිලියන 268 ට ළඟා කරවමින් 2022 දී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායමේ 74% වර්ධනයක් රජය අපේක්ෂා කරයි (2.4 වගුව). එක් වරක් පමණක් අය කරනු ලබන අධිභාර බද්දකින් සහ අපේක්ෂිත නාමික ආර්ථික වර්ධනය තුළින් ආදායම රැස් කිරීමෙන් ඉහත වර්ධනය අපේක්ෂා කෙරේ.

බදු අනුපාතික 28% සිට 24% දක්වා අඩු කිරීම 2020 ජනවාරි මස සිට බලාත්මක වූ බදු සංශෝධන සහ ගෝලීය වසංගත තත්ත්වය තුළ උපයන විට ගෙවීමේ බද්ද, රඳවා ගැනීමේ බද්ද සහ ආර්ථික සේවා ගාස්තු අහෝසි කිරීම නිසා සංස්ථාපිත බදු ආදායම 2019 වූ ශ්‍රී ලංකා රුපියල් බිලියන 273 සිට 2020 දී ශ්‍රී ලංකා රුපියල් බිලියන 228 දක්වා පහත වැටී ඇත.

නිරීක්ෂණ:

- යෝජිත අධිභාර බද්ද එය පනවනු ලබනු ඇති බදු පදනම පෙන්නුම් නොකරයි.
- ඇස්තමේන්තු කර ඇති පරිදි ආර්ථිකය 5% ක වර්ධන ඉලක්කයක් අත් කර ගැනීම මත සංස්ථාපිත බදු ආදායම ද රඳා පවතිනු ඇති බවද සැලකිල්ලට ගත යුතුය.

2.1.3 උපයන විට ගෙවීමේ බද්ද

2022 අයවැය ශ්‍රී ලංකා රුපියල් බිලියන 18 ක්, උපයන විට ගෙවීමේ බදු ආදායම ලෙස තක්සේරු කරන අතර, එය 2021 දී අපේක්ෂිත බදු ආදායම රැස්කිරීම වූ ශ්‍රී ලංකා රුපියල් බිලියන 15 ට වඩා 20% ක වර්ධනයකි (2.4 වගුව). නාමික වැටුප් වර්ධකය හා සමඟ වැඩි වූ ස්වේච්ඡා අනුකූලතාව මගින් මෙය සාක්ෂාත් කර ගැනීමට නියමිතය.

2020 ජනවාරි මස සිට බලාත්මක වූ බදු සංශෝධනය -උපයන විට ගෙවීමේ බද්දෙන් නිදහස් සීමාව මසකට ශ්‍රී.ලං.රු. 100,000 සිට ශ්‍රී.ලං.රු. 250,000 දක්වා වැඩි කිරීම මෙන්ම, 2020 වර්ෂය ආර්ථිකයේ පසුබෑම හේතුවෙන් 2019 ශ්‍රී ලංකා රුපියල් බිලියන 49 ක් වූ උපයන විට ගෙවීමේ බදු ආදායම 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 15 දක්වා පහත බැස ඇත.
උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට 2020 දී රජය පූර්ව ගෙවීමේ ආදායම් බද්ද හඳුන්වා දුන්නද (මුදල් අමාත්‍යාංශයේ 2020 වාර්ෂික වාර්තාව බලන්න), උපයන විට ගෙවීමේ බද්ද අහෝසි කිරීමට මෙය සමපාත කල නොහැක.

උපයන විට ගෙවීමේ බද්දේ ශ්‍රී ලංකා රුපියල් බිලියන 3 ක වැඩිවීමක් ආදායම 20% කින් වර්ධනය වීමක් සංඥා කරන්නේ ඒ හා ආශ්‍රිත කිසිදු ප්‍රතිපත්ති වෙනසකින් තොරවය. ද.දේ.නි. හි 5% අපේක්ෂිත වර්ධනය අනුව ගත් කළ මෙය අධිතක්සේරුවකි.

2.1.4 රඳවා ගැනීමේ බද්ද

රජය ශ්‍රී ලංකා රුපියල් බිලියන 12 ක රඳවා ගැනීමේ බදු ආදායමක් අපේක්ෂා කරයි. රඳවා ගැනීමේ බද්දේ අපේක්ෂිත 9% ක වර්ධනය වෘද්ධි වැඩිවීම මත පදනම්ව ඇත. 2020 ක්‍රියාත්මක කරන ලද අනුපාතිකයන් සහ ප්‍රතිපත්ති 2022 වර්ෂයට අදාල විය. අනේවාසිකයන් හට පමණක් දැනට එය අදාළ වේ. (මුදල් අමාත්‍යාංශයේ 2020 වාර්ෂික වාර්තාව බලන්න)

2020 ජනවාරි මස සිට බලාත්මක වූ බදු සංශෝධන මෙන්ම ආර්ථිකයේ පසුබෑම හේතුවෙන් රඳවා ගැනීමේ බදු ආදායම පහත වැටී ඇත (2.4 වගුවේ දක්වා ඇති පරිදි 2019 ශ්‍රී ලංකා රුපියල් බිලියන 50 සිට 2020 ශ්‍රී ලංකා රුපියල් බිලියන 10 තෙක්).

බදු ආදායමේ ඇස්තමේන්තුගත ශ්‍රී ලංකා රුපියල් බිලියන 1 ක වැඩිවීම රඳවා ගැනීමේ බදු ආදායමේ 9% ක වැඩි වීමක් සමඟ සම්බන්ධය. අපේක්ෂිත ආර්ථික වර්ධනය 5% ක් පමණක් වන බැවින් මෙය අධිතක්සේරුවක් වීමට ඉඩ ඇත.

ක්‍රියාමාර්ග: යෝජිත බදු සංශෝධන පහත දක්වා ඇත:

බදු සංශෝධනය	විස්තරය	අපේක්ෂිත ආදායම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)
එක් වරක් පමණක් අය කරන අධිභාර බද්ද	2020/2021 තක්සේරු වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 2 වැඩි බදු අය කළ හැකි ආදායමක් සහිත පුද්ගලයන් හෝ සමාගම් මත 25%.	100,000
සමාජ ආරක්ෂණ දායකත්වය	වාර්ෂික පිරිවැටුම් සීමාව ශ්‍රී ලංකා රුපියල් මිලියන 120 ඉක්මවීමේදී 2.5%	140,000

මූලාශ්‍රය: 2022 අයවැය කථාව.



2.2 දේශීය භාණ්ඩ හා සේවා මත බදු

2.6 වගුව: දේශීය භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදු වලින් ලැබෙන ආදායම (ශ්‍රී ලංකා රුපියල් බිලියන)

	ආදායම					වැඩිවීම%	
	2018	**2019**	**2020**	**2021 සංශෝධිත ඇස්තමේන්තු**	**2022 ඇස්තමේන්තු**	**2020 - 2021ඇ**	**2021ඇ-2022ඇ**
එකතු කළ අගය මත බදු	462	444	234	310	424	32.5	36.8
නිෂ්පාදන බද්ද	484	399	322	311	430	-3.4	38.3
මත්පැන්	114	115	121	140	180	15.7	28.6
සිගරට්	92	87	94	90	120	-4.3	33.3
ඛනිජ තෙල්	66	62	53	55	75	3.8	36.4
මෝටර් වාහන	204	130	49	20	45	-59.2	125.0
වෙනත්	8	5	5	6	10	20.0	66.7

මූලාශ්‍රය:2020 වාර්ෂික වාර්තාව, මුදල් අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.7 වගුව: භාණ්ඩ හා සේවා මත පනවනු ලබන බදු වලින් ලැබෙන ආදායම (දළ දේශීය නිෂ්පාදිතයේ %)

	2021 ඇස්තමේන්තුගත	**2022 ඇස්තමේන්තුගත**
එකතු කළ අගය මත බදු	1.9	2.3
නිෂ්පාදන බද්ද	1.9	2.3
මත්පැන්	0.8	1.0
සිගරට්	0.5	0.6
ඛනිජ තෙල්	0.3	0.4
මෝටර් වාහන	0.1	0.2
වෙනත්	0.0	0.1

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, සහ ගණනය කරන ලද. 2021 සහ 2021 වර්ෂ සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම පිළිවෙළින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 16,476 ක් සහ 18,511 ක් ලෙස ගත යුතුය.

2.2.1 එකතු කළ අගය මත බද්ද

උපකල්පනය: එකතු කළ අගය මත බදුවලින් ලැබෙන ආදායම ශ්‍රී ලංකා රුපියල් බිලියන 14කින් වැඩිවන බව

ක්‍රියාමාර්ගය: මූල්‍ය සේවා සඳහා දැනට පනවනු ලබන එකතු කළ අගය මත බද්ද දැනට පවතින 15% සිට 18% දක්වා වන ලෙස අනුපාතයෙහි සිදු කරනු ලබන වැඩි කිරීමක් තුළින් ඉහත වැඩිවීම ප්‍රධාන වශයෙන්ම සිදු වේ. නිෂ්පාදනය, ආනයනය සහ අනෙකුත් සේවා මත පනවනු ලබන එකතු කළ අගය මත බද්ද තවදුරටත් 8% පවතිනු ඇත. තවද වෛද්‍ය උපකරණ, යන්ත්‍රෝපකරණ, උපකරණ, ඖෂධ, රෝහල් ගෘහ භාණ්ඩ සැපයීම සහ ආනයනය සඳහා වැට් බදු නිදහස් කිරීම් ලබා දෙනු ලැබ ඇති අතර, එය වසංගත කාලය තුළදී ඉදිරිපත් කරන ලද සාධාරණ යෝජනාවක් වේ.

විශ්ලේෂණය: මූල්‍ය සේවා මත සහ 2022 වර්ෂයේ දී ආර්ථික කටයුතු වල අපේක්ෂිත වර්ධනය හේතුවෙන් වර්ධනය වන සේවාවන් සංඛ්‍යාව මත පනවනු ලබන එකතු කළ අගය මත බදු අනුපාතය හේතුවෙන් ආදායමෙහි අපේක්ෂිත වර්ධනය සාධාරණ වන්නේ එහිදී ඇතිවන ඉහළ ගනුදෙනු පිරිවැය හේතුවෙන් මූල්‍ය සේවාවන් සඳහා පවතින ඉල්ලීම අඩු නොවන්නේ නම් පමණි. එලෙසම, යම් යම් සේවාවන් සඳහා ලබා දෙනු ලබන එකතුකල අගය මත බදු නිදහස් කිරීම් මගින්, අයකර ගනු ලබන එකතු කළ අගය මත බදු ප්‍රමාණය පහළ යනු ඇත. සත්‍ය වශයෙන්ම ලැබෙන ආදායම අපේක්ෂිත රුපියල් බිලියන 14 ට වඩා අඩුවීම සිදුවිය හැකිය.

2.2.2 නිෂ්පාදන බද්ද

උපකල්පනය: නිෂ්පාදන බදු සංශෝධනය මගින් රුපියල් බිලියන 25 ක අතිරේක ආදායමක් ගෙන එනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ක්‍රියාමාර්ගය: සිගරට් සහ මත්පැන් මත පනවනු ලබන නිෂ්පාදන බදු අනුපාතයන් සංශෝධනය කිරීම.

විශ්ලේෂණය: විශේෂයෙන්ම, සිගරට්ටුවක් සඳහා පනවනු ලබන බද්ද රුපියල් 5 කින් ඉහළ නැංවීම මගින් සිගරට් මත පනවනු ලබන බදු ඉහළ නැංවීම සඳහා කරනු ලබන යෝජනාව මගින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 8 ක ආදායමක් ගෙන එනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. තව ද, මෝටර් වාහන අනතුරු ආදිය හා සම්බන්ධ ගාස්තු මගින් තවත් රුපියල් බිලියන 4 ක අතිරේක ආදායමක් ගෙන එනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

2.3 විදේශීය වෙළඳාම මත බදු

2.8 වගුව: විදේශීය වෙළඳාම මත බදු

සංරචකය	2021.11.12 ඇස්තමේන්තු මත පදනම්ව				නිරීක්ෂණ මත පදනම්ව	
	2022		2022 සඳහා යෝජිත සංශෝධනය		2021	
	ශ්‍රී ලංකා රුපියල් බිලියන	දළ දේශීය නිෂ්පාදිතයේ %ලෙස	ශ්‍රී ලංකා රුපියල් බිලියන	දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස	ශ්‍රී ලංකා රුපියල් බිලියන	දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස
ආනයන පාදක බදු	740	4.00%	160	0.87%	580	3.13%
ව.ගු.බ.	175	0.95%	35	0.19%	140	0.76%

සටහන: ව.ගු.බ. යනුවෙන් හඳුන්වනු ලබන්නේ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ය. 2021 සහ 2022 වර්ෂ සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් බිලියන16,476 ක් සහ 18,511 ක් ලෙසට ගත යුතුය.

2.3.1 ආනයන පාදක බදු

2.9 වගුව: ආනයන පාදක බදු						
ආදායම් වර්ගය	**2021.11.12 දිනට ඇස්තමේන්තු (ලංකා ශ්‍රී රුපියල් බිලියන)**	**මුළු ආදායමෙහි ප්‍රතිශතය[3]**	**2015-2019 වර්ධනය (කාලසීමාවේ යසාමාන්‍ය) [4]**	**2021 සිට ඉහළ යාම[5] (ලංකා ශ්‍රී රුපියල් බිලියන)**	**ප්‍රතිපත්ති වෙනස් කිරීම් හේතු කොට ගෙන**	**සාමාන්‍ය වර්ධනය හේතු කොටගෙන (ලංකා ශ්‍රී රුපියල් බිලියන)**
ආනයන පාදක බදු	740	37.24%	5.50%	160	0	160

මූලාශ්‍රය: 2021.11.12 දිනට ඇස්තමේන්තු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සූරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

උපකල්පන: 2021 වර්ෂයේදී පැවැති ඇමරිකානු ඩොලර් මිලියන 18,978 සිට 2022 වර්ෂයේ දී ඇමරිකානු ඩොලර් මිලියන 19,005 දක්වා ආනයනයන් වර්ධනය වනු ඇති බවට රජය විසින් අපේක්ෂා කරනු ලැබේ.[6] මේ අනුව, ඉහළ යන ආනයන පදනම සහ තීරු ගාස්තු අනුපාතයන් ඉහළ දිශාවට සංශෝධනය කිරීම[7] මගින් ආනයන පාදක බදු මගින් ලැබෙන බදු ආදායම 2021 දී ලැබුණු ශ්‍රී ලංකා රුපියල් බිලියන 581 සිට 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා රුපියල් බිලියන 740 දක්වා ඉහළ යනු ඇති බවට අපේක්ෂා කරනු ලැබේ. (සංශෝධිත ඇස්තමේන්තු)

ක්‍රියාමාර්ග: එච්.එස්. සංකේත 1,776 ක් ආනයන පාලකවරයාගේ රෙගුලාසි වලට යටත් විය යුතු බවට මුදල් අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති අතර, මෙම බොහෝ එච්.එස්. සංකේත සෙස් බද්දට යටත් වේ. මත්පැන්, සිගරට්, මෝටර් වාහන සහ දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන වලට අදාල එච්.එස්. සංකේතයන් හැර, ආනයනය සඳහා බලපත්‍ර ලබා දීමේ යාන්ත්‍රණය සහ රේගු ගාස්තු සරල කිරීමට අමාත්‍යාංශය විසින් යෝජනා කරනු ලැබේ. මීට අමතරව, ප්‍රමිති ආයතනය සහ නිරෝධායන බලධාරීන් විසින් එකී ආනයනයන් සඳහා නිෂ්කාශනයන් ලබා දුන් පසු ඒ සඳහා රේගු නිෂ්කාශන ලබාදෙනු ඇත. බදු වල (විශේෂයෙන්ම විශේෂ වෙළඳ භාණ්ඩ බදු) ඉහළ දිසාවට සිදුකරනු ලබන නව සංශෝධනයන් සහ ආනයනයන් වැඩි දියුණු කිරීම සඳහා දැනට පවතින ආනයන පාලනයන් ක්‍රමිකව අදියරෙන් අදියර නතර කිරීමක් දක්නට නොලැබේ.

විශ්ලේෂණය: ගෝලීය ආර්ථිකයන්ගේ පුනරුදය හේතු කොටගෙන ගෝලීය වෙළෙඳපොළ තුළ වෙළෙඳ භාණ්ඩ සහ තෙල් මිල ගණන් ඉහළ යා හැකි බැවින් 2022 වර්ෂයේ ආනයනවල ඇ.ඩො. මිලියන 27 ක සුළු ඉහළ යාමේ ඇස්තමේන්තුව පහළ සීමාවට ආසන්න අගයක් විය හැක. එයට අමතරව, දේශීය ආර්ථිකයේ පුනරුදය සහ අපනයන ආදේශන හේතු කොට ගෙන ආනයනික අමුද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම ඉහළ යා හැකිය. එපරිද්දෙන්, 2021 වසරට සාපේක්ෂව ආනයන බදු සඳහා ඉහළ පදනමක් අපේක්ෂා කළ හැකිය. කෙසේ වුවද, 2021 වසරට සාපේක්ෂව සුළු වර්ධනයක් වන ඇ.ඩො. මිලියන 19,005 ක තක්සේරු කළ ආනයන සහ අඛණ්ඩව පවත්නා ආනයන සීමාවන් හේතු කොට ගෙන, ශ්‍රී ලංකා රුපියල් බිලියන 160 ක ආදායම් වර්ධන අපේක්ෂාව (2021 ඇස්තමේන්තු හා සංසන්දනාත්මකව 27.59% ක්) ලබා ගත හැකි ආදායම් වර්ධන උපරිම සීමාවට වඩා ඉහළ අගයක් විය හැකිය.

[3] 2022 වර්ෂයෙහි ඇස්තමේන්තුගත බදු ආදායම ශ්‍රී ලංකා රුපියල් බිලියන 1,987කි.

[4] ආනයන බදු, සෙස් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු (SCL) එකතුව

[5] 2021 වර්ෂයෙහි ඇස්තමේන්තුගත ආනයන පාදක බදු ශ්‍රී ලංකා රුපියල් බිලියන 580කි.

[6] 2021.11.12අයවැය කතාවේදී මුදල් අමාත්‍යවරයා විසින් සකස් කරන ලද සංශෝධිත වියදම් ඉලක්කය.

[7]ඇමුණුමට අනුව, "රජයේ මුදල් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව සඳහා 2022 සඳහා වන අයවැය ඇස්තමේන්තු පිළිබඳ වාර්තාව සඳහා දත්ත අවශ්‍ය වේ". 2021 දී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) පනවන ලද හෝ ඉහළට සංශෝධනය කරන ලදී.

නිරීක්ෂණය: ආනයන පදනම් කොටගත් බදු තුළින් අපේක්ෂා කරනු ලබන බදු ආදායම් ඉහළ යාම පදනම් වන්නේ 2022 වසරේදී ආනයන ඉහළ යනු ඇති බවට සහ 2021 වසරේදී ඉහළ නංවන ලද බදු ඒ ආකාරයෙන්ම පවතිනු ඇති බවට පවත්නා අපේක්ෂාව මතයි. ගෝලීය ආර්ථික පුනරුදය සහ වෙළෙඳ භාණ්ඩ හා තෙල් මිල ඉහළ යාම වැනි බාහිර තත්ත්වයන් සහ ලෝක වසංගතය ආශ්‍රිත සංචරණ සීමා ඉවත් කිරීමෙන් පසු ආර්ථිකය පුනරුදය කිරීම සහ පාරිභෝගික වැය කිරීම් සඳහා වන ඉහළ ඉල්ලුම වැනි අභ්‍යන්තර තත්ත්වයන් මත 2021 වසරට සාපේක්ෂව ආදායම් වර්ධනයක් අපේක්ෂා කළ

හැකිය. කෙසේ වුවද, එය පවත්නා ආනයන සීමාවන් ඉවත් කිරීම මත පදනම් වේ. මෑත වර්ෂවලදී ආනයන බදු ආදායම් වර්ධන අනුපාතය පහළ යාමත් සමග අපේක්ෂිත වර්ධන මට්ටම අධිතක්සේරුවක් විය හැකිය.

2.10 වගුව: වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද (ව.ගු.බ.)

ආදායම් වර්ගය	2021.11.12 ඇස්තමේන්තු (ශ්‍රී ලංකා රුපියල් බිලියන)	සමස්ත ආදායම් ප්‍රතිශතය	2015-2019 වර්ධනය (කාලසීමාවේ සාමාන්‍යය)[8]	2021 සිට ඉහළ යාම [9] (ශ්‍රී ලංකා රුපියල් බිලියන)	ප්‍රතිපත්ති වෙනස් කිරීම් හේතු කොට ගෙන	සාමාන්‍ය වර්ධනය හේතු කොටගෙන (ලංකා රුපියල් බිලියන)
ව.ගු.බ.	175	8.81%	12.38%	35	0	35

මූලාශ්‍රය: 2021.11.12 ඇස්තමේන්තු. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

උපකල්පනය: 2022 වසරේදී ඇ.ඩො.මිලියන 18,978 සිට ඇ.ඩො.මිලියන 19,005 මට්ටම දක්වා ආනයන වර්ධනය වනු ඇති බවට රජය අපේක්ෂා කරනු ලබන අතර ඉහළ ආනයන පදනම හේතු කොට ගෙන 2020 හා සාපේක්ෂව වරාය හා ගුවන් සේවා බද්ද ශ්‍රී ලංකා රුපියල් බිලියන 35කින් ඉහළ යනු ඇත.

ක්‍රියාමාර්ග: වරාය හා ගුවන් සේවා බදු අනුපාතය සහ ආවරණය තුළ කිසිදු වෙනස්කමක් යෝජනා කරනු නොලැබේ. එපරිද්දෙන්, ආනයන වර්ධනය සහ කාර්යක්ෂම ආදායම් එක්රැස් කිරීම හේතු කොට ගෙන ආදායම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

විශ්ලේෂණය: සාකච්ඡා කරන ලද පරිදි, විදේශ වෙළඳාම මත බදු යටතේ, පවත්නා ආනයන පාලන ඉවත් කිරීම මත පදනම්ව, දේශීය හා බාහිර සාධක ආනයන වල වර්ධනය සඳහා හිතකර වේ.

නිරීක්ෂණය: 2022 වසරට සාපේක්ෂව වරාය හා ගුවන් සේවා බදු ආදායම 25% කින් ඉහළ යනු ඇති බවට පවත්නා අපේක්ෂාව අධිතක්සේරුවක් විය හැකිය. 2015-2019 අතර සැබෑ වර්ධනය 12.38% ක් විය.

[8] වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL), ආනයන බදු, සෙස් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) එකතුව

[9] 2021 වර්ෂයෙහි ඇස්තමේන්තුගත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම ශ්‍රී ලංකා රුපියල් බිලියන 140කි.

III කොටස: අයවැයේ වියදම් ඇස්තමේන්තු

3.1 පුනරාවර්තන

3.1 වගුව: පුනරාවර්තන වියදම්				
	අයවැය කතාවේ සංඛ්‍යාලේඛන (ශ්‍රී ලංකා රුපියල් බිලියන)		මුදල් අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන (ශ්‍රී ලංකා රුපියල් බිලියන)	
වියදම් වර්ගය	**2021 සං. ඇස්ත.**	**2022 ඇස්ත.**	**2021 සං. ඇස්ත.**	**2022 ඇස්ත.**
මුළු පුනරාවර්තන වියදම්	2,817	2,996	2,756	2,935
වැටුප් හා වේතන	887	1,015	840	968
භාණ්ඩ හා සේවා	198	203	184	189
පොළිය	1,055	1,115	1,055	1,115
සහනාධාර හා පැවරුම්	677	663	677	663

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, 2020 වාර්ෂික වාර්තාව, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

2021 සහ 2022 යන වර්ෂ දෙකටම අදාළව සමස්ත පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් අයවැය කතාව තුළ ඉදිරිපත් කරන ලද සංඛ්‍යා සහ මුදල් අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යා අතර විෂමතාවයන් පවතී. සංඛ්‍යා අතර මෙම අනනුකූලතාවය නිර්මාණය වී ඇත්තේ 'වැටුප් හා වේතන' හා 'භාණ්ඩ හා සේවා' යන වියදම් කාණ්ඩ දෙකට අදාළ ඇස්තමේන්තු තුළ පවත්නා වෙනස්කම් හේතුවෙනි. 2021 සිට 2022 දක්වා මුළු පුනරාවර්තන වියදම් වල සමස්ත ඉහළයාමත් මෙම සංඛ්‍යා මගින් පෙන්නුම් කරනු ලැබේ. මෙම ලේඛනය මගින් සලකා බලා ඇත්තේ මුදල් අමාත්‍යාංශය මගින් සපයන ලද සංඛ්‍යා ලේඛන වන අතර එම සංඛ්‍යා මත පදනම්ව විශ්ලේෂණය සිදු කොට ඇත. ඒ අනුව, 2021 සිට 2022 දක්වා මුළු පුනරාවර්තන වියදම් වල 6.49% ක වර්ධනයක් පවතී.

3.2 වගුව: පුනරාවර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්					
	2021	**2022**	**වර්ධනය 2021-2022**	**දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස 2021 ඇ.**	**දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස 2022 ඇ.**
මුළු පුනරාවර්තන වියදම	2,756	2,935	6.49	16.7	15.9
වැටුප් සහ වේතන	840	968	15.24	5.1	5.2
භාණ්ඩ හා සේවා	184	189	2.72	1.1	1.0
පොළී ගෙවීම්	1,055	1,115	5.69	6.4	6.0
සහනාධාර හා පැවරුම්	677	663	-2.07	4.1	3.6

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, 2020 වාර්ෂික වාර්තාව, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය

සටහන: වසර අගින් යොදා ඇති 'ඇ.' අකුර මගින් ඇස්තමේන්තුගත යන්න අදහස් වේ. 2021 සහ 2022 වසර සඳහා දළ දේශීය නිෂ්පාදිත අගයන් වශයෙන් සැලකෙනුයේ පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 16,476 සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 18,511කි.

3.1.1 වැටුප් සහ වේතන

3.3 වගුව: වැටුප් සහ වේතන						
වියදම් වර්ගය	**2021 වර්ෂයේ ඇස්තමේන්තු 2021 (රු. බි.)**	**සමස්ත වියදමෙහි ප්‍රතිශතය (2022)**	**2015-2020 වර්ධනය (කාල පරිච්ඡේදය තුළ සාමාන්‍යය)**	**2021 වර්ෂයේ සිට වැඩිවීම 2021 (රු. බි.)**	**ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් (රු. බි.)**	**සාමාන්‍ය වර්ධනය සහ වඩා යහපත් පරිපාලනය හේතුවෙන් (රු. බි.)**
වැටුප් සහ වේතන	840	25.26 %	7.29 %	128	37.6	90.4

උපකල්පන: වැටුප් සහ වේතන සඳහා වන වියදම 2021 සිට 2022 දක්වා 15.23% ක ප්‍රමාණයකින් වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

ක්‍රියාමාර්ග: අයවැය කතාවේ දී ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 30 ක් වෙන් කිරීමට යෝජනා කර ඇත. එයට අමතරව, අභ්‍යාසලාභීන් ලෙස දැනටමත් සේවයේ යෙදී සිටින උපාධිධාරීන් 53,000 ට වැඩි පිරිසකට ස්ථිර පත්වීම් ලබා දෙනු ලබන අතර ඒ සඳහා රුපියල් බිලියන 7.6 ක ප්‍රතිපාදනයක් යෝජනා කර ඇත. ඒ අනුව, 2021 සිට 2022 දක්වා රුපියල් බිලියන 128 ක් වූ මුළු වැඩිවීමෙන් රුපියල් බිලියන 37.6 ක් ප්‍රතිපත්ති සංශෝධන හේතුවෙන් වන අතර, ඉතිරි රුපියල් බිලියන 90.4 සාමාන්‍ය වර්ධනය හේතුවෙන් වේ.

විශ්ලේෂණය: වැටුප් හා වේතන සඳහා යෝජිත වෙන් කිරීම රජයේ මුළු වියදමෙන් 26.36% ක් වන අතර, එය 2022 වර්ෂය සඳහා වන මුළු පුනරාවර්තන වියදමෙන් 34.58% ක් වේ. 2015-2020 කාල පරිච්ඡේදය තුළ වැටුප් හා වේතන සඳහා වූ වියදම්වල සාමාන්‍ය වාර්ෂික වර්ධනය 7.29% කි.

නිරීක්ෂණ: රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම හේතුවෙන් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ නව කණ්ඩායමක් (විශ්‍රාම යන වයස දීර්ඝ නොකළේ නම් විශ්‍රාම යාමට නියමිතව සිටි කණ්ඩායම) සේවයේ රැඳී සිටින බැවින් වැටුප් සහ වේතන සඳහා වැය වන මුදල වැඩි වීමට ඉඩ ඇත. වැටුප් හා වේතනවල වැඩිවීම මගින් මෙය පිළිබිඹු විය යුතුය.

3.1.2 භාණ්ඩ හා සේවා

3.4 වගුව: භාණ්ඩ හා සේවා						
වියදම් වර්ගය	**2021 වර්ෂයේ ඇස්තමේන්තු (රු. බි.)**	**සමස්ත වියදමෙහි ප්‍රතිශතය (2022)**	**2015-2020 වර්ධනය (කාල පරිච්ඡේදය තුළ සාමාන්‍යය)**	**2021 වර්ෂයේ සිට වැඩිවීම (රු. බි.)**	**ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් (රු. බි.)**	**සාමාන්‍ය වර්ධනය සහ වඩා යහපත් පරිපාලනය හේතුවෙන් (රු. බි.)**
භාණ්ඩ හා සේවා	184	5.19 %	4.88 %	5	5	-

උපකල්පන: භාණ්ඩ හා සේවා සඳහා වන වියදම 2021 සිට 2022 දක්වා 2.72% ක ප්‍රමාණයකින් වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

ක්‍රියාමාර්ග: 2021 සිට 2022 දක්වා 'භාණ්ඩ සහ සේවා' වියදම් කාණ්ඩයේ රුපියල් බිලියන 5 ක සමස්ත වැඩිවීම රජයේ සේවකයන් සඳහා යතුරුපැදි මිලදී ගැනීමේ යෝජනාව හේතුවෙන් විය හැකිය.

විශ්ලේෂණය: 2022 අයවැයෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා රුපියල් බිලියන 189 ක් වෙන් කිරීමට යෝජනා කර ඇත. එය සමස්ත රාජ්‍ය වියදමෙන් 5.27% ක් සහ සමස්ත රාජ්‍ය පුනරාවර්තන

වියදමෙන් 6.92% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2015-2020 කාලසීමාව සඳහා භාණ්ඩ හා සේවා සඳහා වන වියදම්වල 4.88% ක සාමාන්‍ය වාර්ෂික වර්ධනයක් පැවතුණි.

3.1.3 පොළී ගෙවීම්

3.5 වගුව: පොළී ගෙවීම්						
වියදම් වර්ගය	**2021 වර්ෂයේ ඇස්තමේන්තු (රු. බි.)**	**සමස්ත වියදමෙහි ප්‍රතිශතය (2022)**	**2015-2020 වර්ධනය (කාල පරිච්ඡේදය තුළ සාමාන්‍යය)**	**2021 වර්ෂයේ සිට වැඩිවීම (රු. බි.)**	**ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් (රු. බි.)**	**සාමාන්‍ය වර්ධනය සහ වඩා යහපත් පරිපාලනය හේතුවෙන් (රු. බි.)**
පොළී ගෙවීම්	1,055	28.50 %	12.70 %	60	අදාල නැත	-

3.6 වගුව: පොළී ගෙවීම්වල ප්‍රවනතා									
	රු. බි.					**වර්ධනය %**		**ද.දේ.නි. කොටස (%)**	
	2018	**2019[a]**	**2020[b]**	**2021 සං. ඇ.**	**2022 ඇ.**	**2020-2021ඇ.**	**2021 - 2022 ඇ.**	**2021 ඇ.**	**2022 ඇ.**
පොළී ගෙවීම්	852	901	980	1,055	1,115	7.6	5.7	6.4	6.0
විදේශීය	185	234	267	265	255	-0.6	-3.8	1.6	1.4
දේශීය	668	667	714	790	860	10.7	8.9	4.8	4.6

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, වාර්ෂික වාර්තාව 2020, සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.

සටහන්: a – හිඟ මුදල් ඇතුළත් වේ , b- තාවකාලික

උපකල්පන: රාජ්‍ය ණය මත පොළී ගෙවීම අයවැයෙහි ඇති විශාලතම තනි වියදම් අයිතමය ලෙස අයවැය කතාවෙහි හඳුනාගෙන ඇත. 2021 සිට 2022 දක්වා පොළී ගෙවීම්වල රුපියල් බිලියන 60 ක වර්ධනයක් පෙන්නුම් කරන අතර, එය 5.69% ක වර්ධනයක් ලෙස දැක්වෙයි.

ක්‍රියාමාර්ග: යෝජිත රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාමාර්ග සහ වියදම් යථාර්ථකරණය කිරීමේ ක්‍රියාමාර්ග පොළී ගෙවීම සඳහා පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

විශ්ලේෂණය: 2022 වර්ෂය සඳහා පොළී ගෙවීම පිණිස අවශ්‍ය වන මුදල රජයේ මුළු වියදමෙන් 28.5% ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. එය පෙර වසරට (2021) සාපේක්ෂව සියයට 2.65 ක අඩුවීමකි. මුළු පුනරාවර්තන වියදම්වල ප්‍රතිශතයක් ලෙස එය 37.99% කි. 2015-2020 කාලය සඳහා සාමාන්‍ය වර්ධනය 12.70% කි.

නිරීක්ෂණ: පොළී ගෙවීම සඳහා වන වියදමෙහි 2015-2020 කාලපරිච්ඡේදය තුළ පස් අවුරුදු සාමාන්‍ය වර්ධනය (12.70 %) සහ 2021-2022 සඳහා ඇස්තමේන්තුගත වර්ධනය (5.69 %) අතර සැළකිය යුතු වෙනසක් ඇත. එවැනි වෙනසක් ඇති විට ඇස්තමේන්තුගත අගයන් නැවත පරීක්ෂා කළ යුතුය.

3.1.4 සහනාධාර සහ පැවරුම්

3.7 වගුව: සහනාධාර සහ පැවරුම්						
වියදම් වර්ගය	**2021 වර්ෂයේ ඇස්තමේන්තු (රු. බි.)**	**සමස්ත වියදමෙහි ප්‍රතිශතය (2022)**	**2015-2020 වර්ධනය (කාල පරිච්ඡේදය තුළ සාමාන්‍යය)**	**2021 වර්ෂයේ සිට වැඩිවීම (රු. බි.)**	**ප්‍රතිපත්ති වෙනස්වීම් හේතුවෙන් (රු. බි.)**	**සාමාන්‍ය වර්ධනය සහ වඩා යහපත් පරිපාලනය හේතුවෙන් (රු. බි.)**
සහනාධාර සහ පැවරුම්	677	16.95 %	14.43 %	-14		

3.8 වගුව: සහනාධාර සහ පැවරුම් සඳහා වන වියදම් (රුපියල් බිලියන)							
	වියදම (රුපියල් බිලියන)					වර්ධනය %	
	2018	**2019** අ	2020ආ	**2021** සං. ඇස්ත.	**2022** ඇස්ත	**2020 – 2021** ඇස්ත	**2021** ඇස්ත.- **2022** ඇස්ත.
සහනාධාර හා පැවරුම්	473	552	717	677	663	-5.6	-2.1
කුටුම්බ	384	456	610	585	565	-4.2	-3.4
විශ්‍රාම වැටුප්	194	228	258	270	265	4.7	-1.9
සමෘද්ධි	39	45	52	53	50	1.1	-5.7
පොහොර සහනාධාරය	27	35	36	35	35	-3.8	0.0
මූල්‍ය නොවන පොදු ව්‍යාපාර	23	26	18	17	18	-4.0	5.9
ආයතනික හා වෙනත්	66	69	89	75	80	-15.7	6.7

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, වාර්ෂික වාර්තාව 2020 සහ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

3.9 වගුව: සහනාධාර සහ පැවරුම් සඳහා වන වියදම් (දළ දේශීය නිෂ්පාදිතයෙන් %)		
	2021	**2022**
සහනාධාර හා පැවරුම්	4.11	3.58
කුටුම්බ	3.55	3.06
විශ්‍රාම වැටුප්	1.64	1.43
සමෘද්ධි	0.32	0.27
පොහොර සහනාධාරය	0.21	0.19
මූල්‍ය නොවන පොදු ව්‍යාපාර	0.10	0.10
ආයතනික හා වෙනත්	0.46	0.43

මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශය, වාර්ෂික වාර්තාව 2020 සහ මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

උපකල්පනය: 2021 වසරේ සිට 2022 දක්වා වූ කාල සීමාව තුළ සහනාධාර සහ පැවරුම් සඳහා වන යෝජිත වෙන් කිරීම්වල රුපියල් බිලියන 14 ක අඩු වීමක් දක්නට ඇත. එමඟින් 2021 වසරේ සිට 2022 දක්වා වූ කාලයේදී 2.1 % ක පහත හෙළීමක් පෙන්නුම් කරයි.

ක්‍රියාමාර්ගය: රාජ්‍ය සේවකයන් විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා ඉහළ නැංවීමෙන් විශ්‍රාම වැටුප් සඳහා වෙන් කරන මුදල් ඉතිරි වීම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා වඩා විද්‍යාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් සමෘද්ධි ගෙවීම් සඳහා වෙන් කළ මුදල් ඉතිරි වීම ඊට හේතු වී තිබේ. (ඉහත 3.8 වගුව බලන්න)

විශ්ලේෂණය සහ නිරීක්ෂණ: 2022 වසර සඳහා වන සමස්ත වියදමෙන් 17.22% ක් පැවරුම් හා සහනාධාරවලට ද 22.59% ක් පුනරාවර්තන වියදම් සඳහා ද වෙන් කෙරෙනු ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස විශ්‍රාම වැටුප් සඳහා වන වියදම් 1.6% සිට 1.4% දක්වා පහත වැටී ඇති අතර සමෘද්ධි සහ පොහොර සහනාධාරය සඳහා වන වියදම් ද සුළු වශයෙන් අඩු වී ඇත.

3.1.5 ප්‍රාග්ධන වියදම්

3.10 වගුව: ප්‍රාග්ධන වියදම්

වියදම් වර්ගය	2021.11.12 දිනට වියදම් (රුපියල් බිලියන) 2022 වසර සඳහා	සමස්ත වියදමෙහි ප්‍රතිශතය (2022)	2015-2020 වර්ධනය (කාල පරිච්ඡේදය තුළ සාමාන්‍යය)	2021 වර්ෂයේ සිට වර්ධනය (රු. බී.)	ප්‍රතිපත්ති වෙනස් වීම හේතුවෙන් (රුපියල් බිලියන)	සාමාන්‍ය වර්ධනය සහ මනා පරිපාලනය හේතුවෙන් (රුපියල් බිලියන)
ප්‍රාග්ධන වියදම්	916	23.8%	6%	346		

මූලාශ්‍රය: 2021.11.12 දිනට ඇස්තමේන්තු සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

උපකල්පනය: 2021 වසරේ අවම මට්ටමක සිට (21.4% ක සංකෝචනයක් එහිදී පැවතුණු අතර) මූර්ත වත්කම් අත්පත් කර ගැනීම 72.6% කින් වර්ධනය වීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් 60.7 % කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2021 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රාග්ධන වියදම 3.3% ක් වූ අතර 2022 වසරේදී එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නව සාමාන්‍යකරණ තත්ත්වයන් යටතේ 5%ක මූර්ත වර්ධනයක් රට අපේක්ෂා කරයි.

ක්‍රියාමාර්ග: 2021 අගයට සාපේක්ෂව නව ප්‍රාග්ධන වියදම් යෝජනා රුපියල් බිලියන 346 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එය සමස්ත වියදමෙන් 23.8% කි.

විශ්ලේෂණය: 2015-2020 අතර කාල සීමාව තුළ ප්‍රාග්ධන වියදම් වර්ධනයේ සාමාන්‍යය 6% කි. කෙසේ වෙතත් 2019 අගයට සාපේක්ෂව 2020 වසරේදී ප්‍රාග්ධන වියදම් 46% කින් පහත වැටී ඇත. 2015 සිට 2020 දක්වා වූ කාල සීමාව තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම වර්ධනයේ සාමාන්‍යය 11.9% කි. 2015-2020 අතර කාල සීමාව තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රාග්ධන වියදම්වල සාමාන්‍යය 4.7% ක් වූ අතර 2020 වසරේදී එහි පහළම අගය වාර්තා විය.

නිරීක්ෂණ: දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් 5% ක් වෙන් කිරීම මෑත ඉතිහාසයේ දක්නට ලැබුණු සම්මතයයි. කෙසේ වෙතත් ‘‘රජයේ ප්‍රාග්ධන වියදම් උපයෝජනය 2018 වසරේදී සියයට 82.1 සිට 2019 වසරේදී සියයට 83.5 ක සුළු වර්ධනයක් වාර්තා කළ අතර’’ එමඟින් කලින් කලට අතිරික්ත ඇස්තමේන්තු හෝ උපයෝජන ගැටළු පෙන්නුම් කෙරිණ.

ස්තුතිය

කාරක සභාවේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා සහාය දැක්වූ සියළුම සාමාජික මන්ත්‍රීවරුන්ට හා නිලධාරීන්ට කාරක සභාව සිය කෘතඥතාවය පිරිනැමීමට අදහස් කරයි.

සාමාජික මන්ත්‍රීවරුන්

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (සභාපති)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු මුජීබුර් රහුමාන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අනුප පැස්කුවල් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

සහභාගී වූ නිලධාරීන්

එස්. ආර්. ආටිගල මහතා, භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශය
ජූඩ් නිලුක්ෂාන් මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
අනෝමා නන්දනී මෙනෙවිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
ආචාර්ය කපිල සේනානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ඩී. කොටින්කඩුව මහත්මිය, අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
කේ.එම්. කුමාරසිරි මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
පී. කොඩිප්පිලි මහතා, සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය, විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
ආචාර්ය නිශා අරුණතිලක මහත්මිය, පර්යේෂණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
එස්.එම්.ඩී.එස්.එස්. රෝහිත මහතා , නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
ජී.එච්.ඩී. ධර්මපාල මහතා, නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
ඩී.ඒ.ඒ. වනිගසේකර මහතා, සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

ඇමුණුම

වගුව අ 1: ඇස්තමේන්තු ලෙස රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලැබුණු ආදායම් ඇස්තමේන්තු (ගිණුම් සැකැස්මේ දල අයවැය)				
ආදායම	**2019**	**2020**	**2021**	**2022**
එකතුව	1,891 (100%)	1,368 (100%)	1495 (100%)	2213 (100%)
බදු ආදායම	1735 (91%)	1216 (89%)	1325 (89%)	1987 (90%)
දේශීය ආදායම්	428 (23%)	268 (20%)	295 (20%)	496 (22%)
සමාගම්	272 (14.4%)	228 16.7%	268 17.9%	466 21%
උපයන විට ගෙවීම	49 (2.6%)	15 (1.1 %)	15 (1.0%)	18 (0.8%)
පොලී සඳහා බදු	50 (2.9%)	10 (0.7 %)	11 (0.7%)	12 (0.5%)
පුද්ගලික	322 (17.0%)	243 (17.7%)	283 (19%)	484 (21.9%)
ආර්ථික සේවා ගාස්තුව	55 (2.9%)	15 (1.1%)	1 (0.1%)	-
භාණ්ඩ හා සේවා බදු	573 (30%)	636 (46%)	650 (43%)	1031 (47%)
එකතු කළ අගය මත බද්ද	444 (23%)	234 (17%)	310 (21%)	424 (19%)
නිෂ්පාදන බද්ද	399 (21%)	322 (24%)	311 (21%)	430 (19%)
මත්පැන්	115 (6.1%)	121 (8.8%)	140 (9.3%)	180 (8.1%)
දුම්වැටි	87 (4.6%)	94 (6.9%)	90 (6.0%)	120 (5.4%)
මෝටර් රථ	130 (6.9%)	49 (3.6%)	20 (1.3%)	45 (2.0%)
බනිජ තෙල්	62 (3.3%)	53 (3.9%)	55 (3.7%)	75 (3.9%)
වෙනත්	5 (0.3%)	5 (0.4%)	6 (0.4%)	10 (0.4%)
ජාතිය ගොඩනැගීමේ බද්ද	71 (3.7%)	2 (0.1%)	0.3 (0.0%)	-
විදුලි සංදේශ බද්ද	18 (0.9%)	13 (0.9%)	13 (0.9%)	18 (0.8%)
බලපත්‍ර බද්ද හා වෙනත්	43 (2.3%)	15 (1.1%)	16 (1.1%)	159 (7.1%)
විදේශ වෙළඳාම් සඳහා වන බද්ද	333 (18%)	364 (27%)	383 (26%)	478 (22%)
ආනයන	98 (5.2%)	114 (8.3%)	100 (6.7%)	115 (5.2%)

සෙස් බද්ද	51 (2.7%)	49 (3.6%)	80 (5.3%)	90 (4.1%)
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	70 (3.7%)	83 (6.0%)	60 (0.0%)	80 (3.6%)
වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද	112 (5.9%)	115 (8.4%)	140 (9.4%)	175 (7.9%)
බදු නොවන ආදායම	156 (8%)	151 (11%)	170 (11%)	226 (10%)

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය, ''අයවැය ඇස්තමේන්තු'': මුදල් අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව (treasury.gov.lk)

වගුව අ 2: අයවැය කථාව හා ප්‍රකාශිත ඇස්තමේන්තු අතර වෙනස සහ රජයේ ආදායම් සම්බන්ධයෙන් පූර්ව උපකල්පන						
	2022 අයවැය කථාවෙන් / 2021.11.12 දින ඇස්තමේන්තු (ආදායම් යෝජනා ඇතුළුව)		**කෙටුම්පත් කළ අයවැය ඇස්තමේන්තුවලින් වෙනස වෙළුම 1-111අ**			
	2022		**2022 සඳහා යෝජිත සංශෝධන**		**2022 වසරේදී සංශෝධිත**	
	රුපියල් බිලියන	**දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස**	**රුපියල් බිලියන**	**දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස**	**රුපියල් බිලියන**	**දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස**
එකතුව	2,213	12.0	226	1.2	2,512	13.6
බදු ආදායම	1,987	10.7	239	1.3	2,226	12.0
දේශීය ආදායම්	496	2.7	100	0.5	596	3.2
සංස්ථාපිත/ සංස්ථාපිත නොවන	466	2.5	100	0.5	550	3.0
උපයන විට ගෙවීම්	18	0.1	0	0.0	0	0.0
පොලිය සඳහා වන බදු	12	0.1	0	0.0	0	0.0
භාණ්ඩ හා සේවා බදු	1,031	5.6	154	0.9	1,201	6.5
එකතු කළ අගය මත බද්ද	424	2.3	14	0.1	438	2.4
නිෂ්පාදන බදු	430	2.3	256	-1.4	174	0.9
මත්පැන්	180	1.0	0	0.0	0	0.0
දුම්වැටි	120	0.6	0	0.0	0	0.0
මෝටර් රථ	45	0.2	0	0.0	0	0.0
ඛනිජ තෙල්	75	0.4	675	-3.7	-600	-3.2
වෙනත්	10	0.1	0	0.0	0	0.0
සමාජ ආරක්ෂණ දායකත්ව			140			

විදේශ ආදායම් සඳහා වන බදු	460	2.5	15	0.6	592	3.2
ආනයන බදුවලින් / සෙස් බද්දෙන්	205	1.1	-15	0.2	190	1.0
ව.ගු./වි. වෙ. බද්දෙන්	255	1.4	0	0.0	0	0.0
බදු නොවන ආදායම	226	1.2	-34	0.0	223	1.2

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය, ‘‘අයවැය ඇස්තමේන්තු’’: මුදල් අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව (treasury.gov.lk)

(අ) ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය, ‘‘අයවැය පිළිබඳ සාරාංශය (2021-2022) ඇමුණුම්’’: 0c3639d9-cb0a-4f9d-b4f9-5571c2d16a8b (treasury.gov.lk)